# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## වංචා වැළැක්වීමේ (සංශෝධන)

**(70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 අගෝස්තු මස 29 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජූලි මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[142 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතෙහි 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ඔප්පුවකට හෝ සාධන පත්‍රයකට අත්සන් තැබීම සඳහා අලුත් අවශ්‍යතා දැක්වීම වේ.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, අන්තිම කැමති පත්‍රයකට, තෙස්තමේන්තුවකට හෝ කොඩිසිල් පත්‍රයකට අත්සන් තැබීම සඳහා අලුත් අවශ්‍යතා දැක්වීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය, 3 වන වගන්තියට කරනු ලැබූ සංශෝධනයට ආනුෂංගික වේ.

***5 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඔප්පු ලියා අත්සන් කිරීම පිටපත් තුනකින් විය යුතු බවට විධිවිධාන සැලසීම වේ.

එල්.ඩී.—ඕ. 71/2021

**(70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2022 අංක  දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. 70 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තිය (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "එය ලිඛිත වන්නේ නම් ද" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(අ) අදාළ ඔප්පුව හෝ සාධන පත්‍රය ලිඛිත වන්නේ නම් ද එකම අවස්ථාවක දී පැමිණ සිටින සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපිට එකී සෑම ලියා අත්සන් කරන්නකු විසින් ම හෝ ලියා අත්සන් කරන්නාගේ බලයලත් තැනැත්තා විසින් අත්සන් කර ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කර ඇත්නම් ද; සහ

(ආ) එකී සෑම ලියා අත්සන් කරන්නකුගේ ම හෝ ඔහුගේ බලයලත් තැනැත්තාගේ වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ එවැනි ලියා අත්සන් කරන්නකුගේ හෝ ඔහුගේ බලයලත් තැනැත්තාගේ මාපට ඇඟිලි දෙකම නොමැති නම්, අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයක ඇඟිලි

සලකුණ අදාළ ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතේ, දෙවන පිටපතේ සහ මූලපත්‍රයේ අත්සනට ඉහළින් හෝ ඒ අසලින් තබා ඇත්නම් මිස,

බලාත්මක නොවිය යුතු ය; හෝ නීතියෙහිලා ආධාර කර ගත නොහැකි විය යුතු ය:

එසේ වුව ද, යම් හේතුවක් මත එවැනි යම් ලියා අත්සන් කරන්නකුගේ හෝ ඔහුගේ බලයලත් තැනැත්තාගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි අවස්ථාවක, ප්‍රසිද්ධ නොතාරිස්වරයාගේ සහතිකයෙහි එකී හේතුව සඳහන් කරනු ලැබිය යුතු අතර, එකී ලියා අත්සන් කරන්නා හෝ ඔහුගේ බලයලත් තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් තබනු ලැබිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) පැවරුම් ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට -

(අ) පවරන්නා සහ පැවරුම්ලාභියා යන දෙදෙනා විසින් ම (1) වන උපවගන්තියේ නියම කර ඇති පරිදි ඔවුන්ගේ අත්සන් සහ මාපට ඇඟිලි සලකුණු තබනු ලැබිය යුතුය; සහ

(ආ) පැවරුම්ලාභියා බාලවයස්කරුවකු වේ නම්, අවස්ථාවෝචිත පරිදි නිත්‍යානුකූල භාරකරු හෝ භාරකරු හෝ නිත්‍යානුකූල භාරකරුගේ හෝ භාරකරුගේ බලයලත් තැනැත්තකු මේ වගන්තියේ කාර්යය සඳහා පැවරුම්ලාභියා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා ශක්‍යතාව සහිත තැනැත්තකු විය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තිය (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "මෙහි මින්මතු සඳහන් කරනු ලබන ආකාරයට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ වචන ඉවත් කර ඒ වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, (2) වන හෝ (3) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට යටත්ව ලියා අත්සන් කර ඇත්නම් මිස වලංගු නොවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(2) තෙස්තමේන්තුකරු හෝ ඔහුගේ බලයලත් තැනැත්තා විසින්, එකම අවස්ථාවක දී පැමිණ සිටින ප්‍රසිද්ධ නොතාරිස්වරයකු සහ සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරිපිට (1) වන උපවගන්තියේ සඳහන් අන්තිම කැමති පත්‍රයේ, තෙස්තමේන්තුවේ හෝ කොඩිසිල් පත්‍රයේ පාමුල හෝ කෙළවර -

(අ) අත්සන් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ඔහුගේ වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ තබනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් හේතුවක් මත තෙස්තමේන්තුකරුගේ හෝ ඔහුගේ බලයලත් තැනැත්තාගේ මාපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි අවස්ථාවක, ඔහු විසින්, අවස්ථාවෝචිත පරිදි, වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් තබනු ලැබිය යුතු ය.

(3) (අ) තෙස්තමේන්තුකරු (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට හැකි තත්ත්වයක නොසිටින අවස්ථාවක, ඔහු විසින් තමා වෙනුවෙන් අත්සන් කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු වෙත බලය ලබා දිය හැකි අතර, තෙස්තමේන්තුකරු (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(ආ) තෙස්තමේන්තුකරු (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට හැකි තත්ත්වයක නොසිටින අවස්ථාවක, ඔහු විසින් තමා වෙනුවෙන් අත්සන් කිරීම සඳහා සහ අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් තැබීම සඳහා වෙනත් යම් තැනැත්තකුට බලය දෙනු ලැබිය හැකි ය.

(ඇ) (අ) සහ (ආ) ඡේදවල සඳහන් අත්සන සහ සලකුණ තෙස්තමේන්තුකරු විසින් ප්‍රසිද්ධ නොතාරිස්වරයකු සහ සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ දී පිළිගනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, යම් හේතුවක් මත තෙස්තමේන්තුකරුගේ හෝ ඔහුගේ බලයලත් තැනැත්තාගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ ලබා ගැනීමට නොහැකි අවස්ථාවක දී, ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින්, එම හේතුව ඔහුගේ සහතිකයේ සටහන් කළ යුතු අතර තෙස්තමේන්තුකරු හෝ ඔහුගේ බලයලත් තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් තබනු ලැබිය යුතු ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "අත්සන" යන වචනය වෙනුවට "අත්සන සහ තෙස්තමේන්තුකරුගේ අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් හෝ එය තෙස්තමේන්තුකරුගේ බලයලත් තැනැත්තා විසින් තෙස්තමේන්තුකරු වෙනුවෙන් ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක දී, අත්සන සහ අවස්ථාවෝචිත පරිදි, එම බලයලත් තැනැත්තාගේ වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන ව්‍යතිරේඛය ඇතුළත් කිරීමෙන්:-

“එසේ වුව ද, තෙස්තමේන්තුකරුගේ හෝ ඔහුගේ බලයලත් තැනැත්තාගේ අවස්ථාවෝචිත පරිදි වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් යම් හේතුවක් මත ලබාගැනීමට නොහැකි වූ අවස්ථාවක දී, තෙස්තමේන්තුකරු හෝ ඔහුගේ බලයලත් තැනැත්තා විසින් ඔහුගේ පාදයක ඇඟිලි සලකුණ තැබිය යුතු අතර ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් එම හේතුව ඔහුගේ සහතිකයේ සටහන් කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) “පිටපත් දෙකකින්” යන වචන වෙනුවට “පිටපත් තුනකින්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

“ඔප්පු පිටපත් තුනකින් ලියා අත්සන් කළ යුතු බව”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.